සවියෙන් පෙරට අපි එකට
e- ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 4. 1 කොටස<br>ශ්‍රී ලංකාව ජනාවාස වීම |

සැකසුම : - වනිතා වල්පිට
ගුරු උපදේශිකා
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරගම

# ශ්‍රී ලංකාව ජනාවාස වීම

# ජනාවාස වීම

- ඕනෑම රටකට මිනිසුන් පැමිණ මුලින්ම පදිංචි වීම හඳුන් වන්නේ ජනාවාස වීම යනුවෙනි.
- අපේ රට ජනාවාස වුයේ හෝමෝ සාපියන් මානවයාගෙනි.
- දූපතක් වු අපේ රට ජනාවාස වීම ඇත්තේ මීට අවුරුදු එක්ලක්ෂ විසි පන්දාහකට පෙරය.
- මෙරට ජනාවාස වුයේ දුර රටකින් පැමිණි අයගෙනි. ඔවුහු අපේ රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වුහ.
- ඒ පිළිබද සාධක හමු වී ඇත්තේ ඉරණමඩු සැකැස්මෙන් හා රත්නපුරේ මැණික් පතල් වලිනි.


ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තව පැවති දේශගුණ කලාප
N
පෝක් සමුද්‍ර සන්ධිය
06 ශුෂ්ක කලාපය
01 පහතරට අර්ධ ශුෂ්ක කලාපය
02 පහතරට වියළි කලාපය
03 පහතරට අතරමැදි වියළි කලාපය
04 පහතරට තෙත් කලාපය
05 කඳුකර අතරමැදි වියළි කලාපය
01 පහතරට අර්ධ ශුෂ්ක කලාපය
25 0 25 km
Copyright
amila.udavatta@gmail.com


# සතුන් දඩයම් කිරීමට පහසු වීම

*මුලින් ම ජීවත් වූ ජනයා දඩයම් කරමින් ජීවත් වූහ.

*පසුව ඔවුන් තැන් තැන්වල ඇවිදිමින් කෑමට ගත හැකි දේ එකතු කර ගත්හ.

*වර්ෂා කාලයේ මොවුන් ගල් ගුහාවල ජීවත් වූහ.

*වැසි නොමැති කාලවලදී මොවුන් සතුන් ගැවසෙන එළිමහන් ස්ථානවල ජීවත් වූහ.



ඡායාරූපය අංක 4.4 දඩයම් යුගයේ මිනිසුන් වාසය කළ තැනක් බවට සොයා ගෙන ඇති කිතුල්ගල බෙලිලෙන.

එදිනෙදා කටයුතු වලට ගල් වලින් තැනූ මෙවලම් භාවිතා කර ඇත.


- ගල් මෙවලම් තැනීමට භාවිතා කළ පාෂාණ වර්ග

  **තිරිවානා


  **කහඳ


  **කළුගල්





ඊට අමතරව සතුන්ගේ ඇට කටු වලින් හා ලී වලින් සෑදු උපකරණ භාවිතා කර ඇත.






පාෂාණ වලින් සෑදු ගල්මෙවලම්









සිතුවම් අංක 2.1 ඉහත සිතුවමේ දක්වා ඇති ආකාරයේ කුඩා ජ්‍යාමිතිකාකා
ගල් මෙවලම් භාවිතයේ දී ඒවා ලී දණ්ඩක හෝ සතෙකුගේ ඇට කැබැල්ලක
අමුණා සකස් කරගෙන තිබේ.

# ආදි මානවයා ආහාරයට ගත් දේවල්

| ශාක ආහාර | සත්ත්ව ආහාර |
|---|---|
| වල්දෙල්<br>වල් කෙසෙල්<br>කටු අල | මුවන්<br>හාවුන්<br>දඬුලේනන් |
| ගෝනල | ඉත්තෑවන් |
| දෝතලු | ඉබ්බන් |
| කිතුල් ඇට | මිමින්නන් |
| කැකුණ ඇට | තලගොයින් |
| | ගොළුබෙල්ලන් |

# ආහාර සොයාගත් ආකාරය



# නෙත් කලාපයේ ජීවත් වූ ආදි මිනිසා ගස් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීමට වැඩි කැමැත්තක් දැක්වීය.

- අතීතයේ ජීවත් වූ ජනතාව අප වාගේම ආභරණ පැළදීමට කැමැත්තක් දැක්වීය
- උදා - මෝර මාළුවකුගේ දතකින් සෑදූ පබළුවක් ගල්ගුහාවකින් සොයා ගෙන ඇත.



ඡායාරූපය අංක 4.3 පාහියන්ගල ගල්ගුහාවෙන් සොයා ගෙන තිබෙන දඩයක්කරුවන් බෙලිකටුවක් විද සකස් කරගත් ගෙලෙහි පළඳින තැල්ලක් (ඡායාරූපය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි)

# මිය ගිය පුද්ගලයින් ආදාහනය කළ ආකාරය (අවමංගල්‍ය චාරිත්‍ර)

- මියගිය තමන්ගේ නෑදෑයින් ඔවුන් ජීවත් වූ ගල් ගුහාවලම වළලා දැමූහ.
- නමා වකුටු කොට මිය ගිය අය වළ දමා ඇත.

  උදා- කුරුවිට බලදොඹලෙන
- මිය ගිය අයගේ හිස් කබලේ ගුරුගල් ආලේප කර ඇත.

  උදා - රාවණා ඇල්ල
- සමහර ඇටසැකිලි වල ගුරු ගල් ආලේප කර ඇත.

  උදා- පාහියන්ගල

# අස්ථි කොටස්වල ගුරුගල් ආලේප කරන ආකාරය



සිතුවම අංක 2.2 තම පවුලේ සාමාජිකයකු හෝ එකට ජීවත් වූ ඥාතියකු මියගිය පසු වාසය කළ ගල් ගුහාව තුළ ම වැළලීම ප්‍රාග් ඓතිහාසික ජනයාගේ සිරිතක් ව තිබිණි. පසු කලෙක ඇට සැකිලි ගොඩට ගෙන ඒවායේ රතු පැහැති ගුරුගල් ආලේප කර කිසි යම් යාතුකර්මයක් කළ බවට සාක්ෂි හමුවී තිබේ.

**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| **ශ්‍රේණිය** | **විෂයය** | **වාරය** | **පාඩම** |
|---|---|---|---|
| **6** | **ඉතිහාසය** | **2** | **4. 1 කොටස -ශ්‍රී ලංකාව ජනාවාස වීම ඇගයීම** |

**සැකසුම: වනිතා වල්පිට**
**ගුරු උපදේශිකා**
**කොට්ඨාසය අධ්‍යාපන කාර්යාලය - බණ්ඩාරගම**

01 ) ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස වල වැසියන්ගේ ආහාර සුදුසු පරිදි වගුගත කරන්න.

| **ශාකමය ආහාර** | **සත්ත්වමය ආහාර** |
|---|---|
| 1 | 1. |
| 2. | 2. |
| 3. | 3. |
| 4. | 4. |

02) ගල් යුගයේ මිනිසුන් උපකරණ සකස් කිරීම සඳහා භාවිතා කළ ද්‍රව්‍ය තුනක් සඳහන් කරන්න.

03) ගල් යුගයේ මිනිසුන් අවමංගල්‍ය චාරිත්‍ර කළ ආකාරය විස්තර කරන්න.

04) පහත වැකි වලට සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

1. ඕනෑම රටක මිනිසුන්ගේ මුල්ම පදිංචි වීම.....................................................නමින් හඳුන්වයි.

2. මුල් කාලින වැසියන් වර්ෂා කාලයේ දි ජිවත් වීමට ........................................ භාවිතා කළහ.

3. ගල් යුගයේ මිනිසුන් ඇටසැකිලි වර්ණ ගැන්වීමට .............................................යොදා ගත්හ.

4. මෙරට ජනාවාස කළ මුල් යුගය.................................................................නමින් හඳුන්වයි.

5. අපේ රට ජනාවාස වුයේ මීට වසර............................................................... පමණ ඉහතදීය.

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **6** | ඉතිහාසය | 2 | **4. 1 කොටස -ශ්‍රී ලංකාව ජනාවාස වීම පිළිතුරු** |

**සැකසුම: වනිතා වල්පිට**
**ගුරු උපදේශිකා**
**කොට්ඨාසය අධ්‍යාපන කාර්යාලය - බණ්ඩාරගම**

1.

| **ශාකමය ආහාර** | **සත්ත්වමය ආහාර** |
|---|---|
| වල්දෙල් | මුවන්,ඉත්තෑවන් |
| වල්කෙසෙල් | දඬුලේනුන්,තලගොයින් |
| කටුඅල | මීමින්නා , ගොළුබෙල්ලන් |

2 . සත්ත්ව ඇට කටු ,ලී දඬු

3. * ගල්ගුහා ඇතුළත මිනී වළලන ලදී.

* නමා වකුටු කොට ඇටසැකිලි වැළලීම

* ඇතැම් ඇට සැකිලිවල ගුරුගල් ආලේප කිරීම

4.

1. ජනාවාසවීම
2. ගල්ගුහා
3. ගුරුගල්
4. ගල් යුගය
5. එක් ලක්ෂ විසිපන්දාහක්

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 4.2 කොටස<br>විජය රජුගේ පැමිණීම හා ජනාවාස ව්‍යාප්ත වීම |

සැකසුම : - වනිතා වල්පිට

ගුරු උපදේශිකා

කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, බණ්ඩාරගම

# විජය රජුගේ පැමිණීම හා ජනාවාස ව්‍යාප්තිය

# හැදින්වීම

* ගල් යුගය  අවුරුදු ලක්ෂයකට වඩා කාලයක් පැවතිණි.
* මීට වසර 5000- 4500 ත් අතර කාලයක ජීවත් වූ ජනයා දියුණු තත්වයකට පත්ව ඇත.
* එම දියුණු  තත්වය පෙන්නුම් කරන සාධක නම්,
    * වළං සෑදීම
    * ගල්මෙවලම් වෙනුවට ලෝහ භාවිතා කිරීමයි.

# ගොවිතැන් කිරීමට පුරුදු වූ මේ ජනයා කඳුකර ප්‍රදේශවල ජීවත් වී ඇත.

* ඒ මීට වසර අවුරුදු 4400 කට පෙරය.
* කඳුකර ප්‍රදේශවල තැනින් තැන පිහිටා ඇති තැනිතලා බිම්වල ජීවත් වූහ. එවැනි තැනිතලා බිම් සානු ලෙස හැදින්වේ.
* එම  ස්ථාන වලින් හමු වූ සාධක අතර,
  * ධාන්‍ය ඇඹරීමට ගන්නා ඇඹරුම් ගල් සහ ධාන්‍ය වර්ග හමු වී ඇත.


# මුල් කාලයේ ගොවීන් භාවිතා කරන ලද ඇඹරුම්ගල්




# මේ යුගයේ ජනයා යකඩ සෑදීමට හැකියාව තිබුණි.

* පොළවේ තිබෙන  යකඩ සහිත ගල් උණු කොට යකඩ සාදා ගෙන ඇත.
* එදිනෙදා ජීවිතයේ ගල්  මෙවලම්  සුළු වශයෙන් යකඩ මෙවලම් භාවිතා කර ඇත.

# වරිච්චි බිත්ති සහිත ගෙවල්වල ජීවත් වී ඇත.



# මියගිය තමන්ගේ නෑදෑයන් වෙනුවෙන් ඔවුහු සොහොන් සාදා අවමංගල්‍ය චාරිත්‍ර පැවැත් වූහ.




# විජය කුමරුගේ පැමිණීම

* විජය කුමාරයා ඇතුළු 700 ක් පිරිස ක්‍රිස්තු පූර්ව 544 දී පමණ ඉන්දියාවේ සිට ලංකාවට පැමිණ පදිංචි වූ බව ඉතිහාසයේ සඳහන් වේ.
* මේ බව අපේ ඉතිහාසය ඉගෙනීමට ඇති මහාවංසය නම් මූලාශ්‍රයේ සඳහන් වේ.

මෙම පිරිස ගොඩබැස ඇත්තේ ලංකාවේ බටහිර මුහුදු වෙරළේ පිහිටි තැනකටය.

එම ස්ථානය **තම්මැණ්ණාව** ලෙස හඳුන්වයි





Paraiyanalankulam
Nulumwewa
A30
Vavuniya
A 29
Silavatturai
Indigollewa
Varikuttiuruwa
Pavat Kulam
A14
A9
Kebitigollewa
Adappankulam
Etawiragollewa
A 29
Nochchikkulam
Anaippapan
Kudiramalei Point
Kokmote
Medavachchiya
B75
Elapatgama
Alutwewa
Wilpaththu
National park
Mahawilachchiya
Alutgama
Kandy Rd
Wilpatta
National Park
A20
Mahakanadarawa
Tank
Puttalam Rd
A9
Pomparippu
Kannimaduwa
Amunukole
Anuradhapura
Mihintale
Park Entrance
Nochchiyagama
Galkulama
Padika
Pahala
Maradahawewa
Sinharagama
Nachchaduwa
Tank
A 28
Kalpitiya
Talawa
Puliyamkulam
Yakalla
Alittana
Ottapuwa
10 mi
10 km
Balagollagama
Rajangane
Reservoir
Eppawala
Kandy Rd
Ritigala Strict
Natural Reserve
Puttalam
©2010 Google
Terms of Use

# විජය කුමරු මෙරටට ගොඩබසින විට මෙහි ජීවත් වූවන් යක්ෂ නමින් හඳුන්වයි.

* එම කණ්ඩායමට කුවේණි නම් කාන්තාව අයත්වේ.
* කුවේණි විජය කුමරුගේ පිරිස අල්ලා සැඟවුවාය.
* තම පිරිස සොයා පැමිණි විජය කුමරු කපු කටිමින් සිටි කුවේණිය මුණ ගැසුණි.



# කුවේණී යක්ෂ ශ්‍රෝතික කාන්තාවක් බව වටහා ගත් විජය කුමරු  ඇය බිය ගන්වා තම පිරිස මුදා ගත්තේය.

* පසුව විජය කුමරු කුවේණී සරණපාවා ගත්තේය.
* ඔවුන් දෙදෙනාට පිරිමි දරුවෙක් හා ගැහැනු දරුවකු ලැබී ඇත.
* ඔවුන් ජීවහත්ථ හා දිසාල ලෙස හඳුන්වයි.

# ඒ වන විට යක්ෂ ගෝත්‍රික කණ්ඩායමට අයත් නගර දෙකක් තිබිණි.

* සිරිසවත්පුව
* ලංකාපුරය
* සිරිසවත්පුව නගරයේ රාත්‍රියේ පැවති උත්සවයකට යක්ෂ ගෝත්‍රිකයන් සහභාගි වූහ. කුවේණි ගේ සහය ලබාගෙන එම යක්ෂ ගෝත්‍රිකයන් විනාශ කිරීමට විජයට හැකි විය.
* යක්ෂ ගෝත්‍රිකයන් විනාශ කළ පසු විජය කුමරු දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රටින් කුමාරිකාවක් ගෙන්වා ගෙන සරණපාවා ගෙන ඇත.

# විජය කුමරු ගේ ඇමතිවරු පිරිස ලංකාවේ විවිධ ප්‍රදේශවල පදිංචි වූහ.

* අනුරාධපුරාය මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශවල ගම්මාන ඇති වූ බව මහාවංශයේ සඳහන් වේ.
* අනුරාධ ඇමති ⟶ අනුරාධගාම
* උපතිස්ස ඇමති ⟶ උපතිස්සගාම
* දීඝායු ඇමති ⟶ දීඝායුගාම

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 4. 2 කොටස - විජය රජුගේ පැමිණීම සහ ජනාවාස ව්‍යාප්තිය ඇගයීම |

**සැකසුම: වනිතා වල්පිට**
**ගුරු උපදේශිකා**
**කොට්ඨාසය අධ්‍යාපන කාර්යාලය - බණ්ඩාරගම**

කෙටි පිළිතුරු සපයන්න.

01) විජය කුමාරයා මෙරටට පැමිණියේ කුමන වර්ෂයේදීද?

02) විජය රජු පැමිණියේ කවර රටක සිටද?

03) විජය කුමරු ඇතුළු පිරිස පැමිණීම පිළිබඳ සඳහන් මූලාශ්‍රය කුමක්ද?

04) විජය රජු මෙරටට ගොඩබට ප්‍රදේශය හඳුන්වන්නේ කවර නමකින්ද?

05) විජය රජු පැමිණීමට පෙර මෙරට සිටි ගෝත්‍රික කණ්ඩායම නම් කරන්න.

06) විජය රජු සරණපාවා ගත් ගෝත්‍රික කාන්තාව නම් කරන්න

07) විජය රජුගේ දරුවන් දෙදෙනා නම් කරන්න

08) විජය රජු පැමිණීමෙන් පසු මෙරට ජනාවාස වූ නගර දෙකක් නම් කරන්න

09) කුවේණි අතහැර විජය රජු විවාහ කරගැනීමට කුමාරිකාවක් ගෙන්වා ගත්තේ කවර ප්‍රදේශයකින් ද?

10) විජය සමඟ පැමිණි පිරිස් මෙරට ජනාවාස කර ගත් ප්‍රදේශ දෙකක් නම් කරන්න.

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | ඉතිහාසය | 2 | 4. 2 කොටස - විජය රජුගේ පැමිණීම සහ ජනාවාස ව්‍යාප්තිය පිළිතුරු |

සැකසුම: වනිතා වල්පිට
ගුරු උපදේශිකා
කොට්ඨාසය අධ්‍යාපන කාර්යාලය - බණ්ඩාරගම

1. ක්‍රි.පූ. 544
2. ඉන්දියාවේ
3. මහාවංසය
4. තම්බපණ්ණිය
5. යක්ෂ
6. කුවේණි
7. ජීවහත්ත හා දිසාල
8. සිරිසවත්ථුව, ලංකාපුරය
9. පාණ්ඩ්‍ය දේශය
10. අනුරාධගාම ,උපතිස්සගාම